දෙපාර්තමේන්තු වක්‍රලේඛ :10/2006

මගේ අංකය :- ප/16/5
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2006.10.

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ
සියළුම අධ්‍යක්ෂවරුන් සහ
ඒකක භාර නිලධාරීන් වෙත,

රාජ්‍ය නිලධාරීන්ගේ රාජකාරී වේලාවන් සහ නිවාඩු

2006.10.02 දින පැවති පරිසර වැඩසටහන පෙ.ව. 8.30 සිට 9.30 දක්වා ක්‍රියාත්මක කරන බව ඔබ වෙත ලිඛිතව දන්වා එවා තිබියදීත්, එදින දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙන් 30% කටත් ප්‍රතිශතයක් පෙ.ව. 8.30 වන විටත් සේවයට වාර්තා කර නොමැති බැව් අනාවරණය විය. එබැවින් මින් ඉදිරියට රාජ්‍ය පරිපාලන වක්‍ර ලේඛ 162, 03/92 හා 06/94 හි විධිවිධාන අනුව පහත සඳහන් පරිදි කටයුතු කිරීමට පියවර ගන්නා ලෙස මෙයින් ඔබට දන්වමි.

i) පැමිණීමේ වේලාවන් සහ ප්‍රමාද වී පැමිණීම පිළිබඳ රෙගුලාසි පහත පරිදි වේ.

- පෙ.ව.8.30ත් පෙ.ව. 9.00ත් අතර ඕනෑම වේලාවක කාර්යාලයට පැමිණෙනු නිලධාරියෙකුට එසේ ප්‍රමාද වන කාලය ප.ව. 4.15 න් පසුව ප.ව. 4.45 තෙක් වැඩ කර ආවරණය කිරීමට ඉඩ දෙනු ලැබේ.
  (රාජකාර් කාලය පෙ.ව.8.30 - ප.ව. 4.15)

- පෙ.ව. 8.00 ත් පෙ.ව. 8.15 ත් අතර කාර්යාලයට පැමිණෙන සුලු සේවකයින්, එසේ ප්‍රමාද වූ කාලය ප.ව. 4.45 න් පසුව ප.ව. 5.00 තෙක් ආවරණය කිරීමට ඉඩ දෙනු ලැබේ.
  (රාජකාර් කාලය පෙ.ව.8.00 - ප.ව. 4.45)
  (සැ.යු: - ඉහත සඳහන් කොන්දේසි අනුව ප්‍රමාද වී පැමිණ රාජකාර වේලාවෙන් පසුව ආවරණය කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දුන්නද මෙය පූර්වාදර්ශයක් කොට නොගත යුතුය)

- පෙ.ව. 8.30 ටත්, පෙ.ව. 9.00 ටත් අතර වේලාවක ප්‍රමාද වී පැමිණ එහෙත් ප්‍රමාද වූ වේලාවන් ආවරණය කිරීමට අපොහොසත් වන එවැනි ප්‍රමාද වන අවස්ථා තුනක් සඳහා ඔහුගේ/ඇයගේ නිවාඩු වලින් දින භාගයක් නිවාඩු ලෙස සලකා කටයුතු කළ යුතුය.

- නිලධාරියෙකු පෙ.ව.9.00 ත් දහවල් 12.30 ත් අතර වේලාවක (කණිෂ්ඨ සේවකයෙකු පෙ.ව. 8.15 ත් දහවල් 12.30 ත් අතර වේලාවක) ප්‍රමාද වී පැමිණීම දින භාගයක නිවාඩුවක් ලෙස සැලකිය යුතුය.

- නිතර ප්‍රමාද වී පැමිණීම ගැන නිලධාරියාට විරුද්ධව ගන්නා යම්කිසි විනයානුකූල ක්‍රියාවන්ට අතිරේකව, පෞද්ගලික ලිපිගොනුවේද සටහන් කළ යුතු බැවින් එවැනි සිද්ධීන් සම්බන්ධයෙන් නොපමාව මා වෙත දන්වා එවිය යුතුය.

ii) රාජකාර් සඳහා වාර්තා කරන සෑම නිලධාරියෙකුම තම **පැමිණීම මෙන්ම පිටවියාමද** යන අවස්ථා දෙකෙහිදීම පැමිණීමේ ලේඛණයේ වේලාව සඳහන් කර අත්සන් කළ යුතුය. එසේ පැමිණීම හෝ පිටවීම පමණක් අත්සන් කර ඇති අවස්ථාවන් සඳහා දිනක නිවාඩුවක් අඩු කිරීමට කටයුතු කළ යුතුය.

iii) කණිෂ්ඨ සේවකයන් සඳහා රාජකාරී කාලය (දිවා භෝජන විවේකයද ඇතුලත්ව) පෙ.ව 8.00 සිට ප.ව. 4.45 දක්වා වේ. ප.ව. 4.15 න් පසුව නිලධාරීන් නොමැති අවස්ථාවන්හිදී එම වේලාවට ඔවුන්ට කාර්යාලයෙන් බැහැරව යෑමට ඉඩදීම පිළිබඳව විරුද්ධත්වයක් නැත. එසේ වුවත් කණිෂ්ඨ සේවකයන්ට අනිකාල දීමනා ගණන් බැලීමේ කාර්යයන්හිදී ප.ව. 4.45 න් පසුව ආවරණය කරනු ලබන කාලසීමාව පමණක් ගණන් ගත යුතුය.

iv) සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියෙක්ම සහ අංශ ප්‍රධානියෙක් හෝ ඒකක ප්‍රධානියෙක් තමා යටතේ සේවය කරන සෑම රාජ්‍ය නිලධරයෙකුම,

- නියමිත වේලාවට පැමිණෙන බවටත්.

- සම්පූර්ණ කාලයම (විධිමත් අනුමැතියකින් රාජකාර්යට නොපැමිණෙන කාලය හා විනාඩි 30 ක දිවා භෝජන විවේක කාලය හැර) අදාළ වැඩ කරන ස්ථානයේ සිටින බවටත්.

- සේවා ස්ථානය වසන තුරු රාජකාරියේ නිරතව සිටින බවටත්.

- විනාඩි 30 (තිහ) කට පමණක් සීමා වන දිවා භෝජන විවේකයක් ගන්නා බවටත්, වග බලා ගත යුතුය.

එස්.සෝ.ආර්.අමරසේකර.
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.